# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1802/22 - 2013 මාර්තු මස 22 වැනි සිකුරාදා - 2013.03.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### පන්විල ප්‍රාදේශීය සභාව

### කුලී රථ වාහන නවතා තැබීමේ අතුරු ව්‍යවස්ථාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වන උප වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 126 වන වගන්තියේ (VII) උප වගන්තියේ ඌ ඡේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පන්විල ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය (1) (අ) වන උප වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2007 අගෝස්තු 17 වැනි දින අංක 1510/42 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද පන්විල ප්‍රාදේශීය සභාවේ කුලී රථ වාහන නවතා තැබීමේ අතුරු ව්‍යවස්ථාවේ තුන්වන අතුරු ව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව තුන්වන අතුරු ව්‍යවස්ථාව ලෙස ඇතුලත් කරන බවත්, එහි සඳහන් අනෙකුත් අතුරු ව්‍යවස්ථා නොවෙනස්ව පවතින බවත්, මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත්, මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය,

2013 ජනවාරි මස 08 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

කුලී රථ වාහන නවතා තැබීමේ අතුරු ව්‍යවස්ථා
පන්විල ප්‍රාදේශීය සභාව

03 ප්‍රාදේශීය සභාව විසින් අනුමත කර සභාපතිවරයා විසින් නිවේදනය කරනු ලබන මෙහි පලමු උපලේඛනයේ දැක්වෙන ස්ථාන වල හැර වෙනත් කිසිදු ස්ථානයක මෝටර් රථයක් කුලියට ධාවනය කිරීමේ අරමුණ ඇතිව නවතා තැබීම නොකළ යුතුය. සභාවේ යෝජනා සම්මුතියක් මගින් වරින් වර එම ස්ථාන සංශෝධනය කිරීම කරනු ලැබිය හැකිය.

04 - 250

1A - PG 001589 — 435 (2013/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*